www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා හමුදාව පූනරින් එල්ටීටීඊ බල කඳවුර අල්ලා ගනී

## Sri Lankan troops capture LTTE stronghold of Pooneryn

**සරත් කුමාර විසිනි**
**2008 නොවැම්බර් 20**

දිවයිනේ වයඹ දිග වෙරලේ බෙදුම්වාදී දෙමළ ඊළම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට අයත් අවසන් බල කඳවුර වන පූනරින් නම් මූලෝපායික උතුරු නගරය සෙනසුරාදා ශ්‍රී ලංකා ආන්ඩුවේ හමුදා විසින් අත්පත් කර ගන්නා ලදි. දින ගනනාවක් පැවති දරුනු සටන්වලින් පසුව එල්ටීටීඊය එය අතහැර ගිය බවක් පෙනී යයි. පූනරින් ඇදවැටීම, 1997 පටන් මේ දක්වා එම නගරය සහ ඒ අවට ප්‍රදේශ පාලනය කල එල්ටීටීඊයට එල්ල වූ සැලකිය යුතු ප්‍රහාරයකි.

හමුදාව දැන් රටේ සමස්ත බටහිර වෙරළම පාලනය කරන අතර එහි ප්‍රතිඵලය ලෙස දකුනු ඉන්දියාව හා දිවයින අතර පිහිටි පටු පෝක් සමුද්‍ර සන්ධිය හරහා පැවති එල්ටීටීඊයේ බොහෝ සෘජු සැපයුම් මාර්ග කපා දමා ඇත. ඊසාන දිග වෙරළ තීරයේ තවමත් ඉතිරිව පවතින එල්ටීටීඊ බල මධ්‍යස්ථාන වෙත දිවෙන වඩා දීර්ඝ මුහුදු මාර්ග ඔස්සේ පැමිනීමට එල්ටීටීඊ සැපයුම්වලට බල කෙරෙනු ඇත. එමගින් එම සැපයුම් ශ්‍රී ලංකා නාවික හමුදාවේ ඇසට හසු වීමේ අන්තරාය වඩා වැඩි වේ.

පූනරින් තවත් ආස්ථානයන්ගෙන් ද මූලෝපායිකව වැදගත් ස්ථානයකි. එය පිහිටා තිබෙන්නේ කිලාලි කලපුවේ දකුනු වෙරළ තීරය ආසන්නයේ ය. කලපුවට උතුරින් පිහිටියේ යාපන නගරය ද ඇතුලු යාපන අර්ධද්වීපයේ ආන්ඩුවේ පාලනය යටතේ පවත්නා ප්‍රදේශ ය. එම ප්‍රදේශවලට සැපයුම් සිදු කිරීමට මිලිටරියට සිදුව ඇත්තේ ගුවනින් හෝ මුහුදු මාර්ගයෙනි. ඒ 32 මහා මාර්ගය සහ කිලාලි කලපුව හරහා මගී බෝට්ටු සේවය මගින් යාපනයට කලින් පැවති සෘජු මාර්ගය යලි විවෘත කර ගැනීමේ විභවය දැන් පවතී.

යාපන අර්ධද්වීපයේ පලාලිවල මිලිටරි මූලස්ථානයට ෂෙල් ප්‍රහාර එල්ල කරනු සඳහා යොදා ගනු ලැබූ ඔවුන්ගේ දිගු දුර කාලතුවක්කු ඉවත් කර ගැනීමට පූනරින් අල්ලා ගැනීම මගින් එල්ටීටීඊයට බල කෙරී ඇත.

2006 ජුලි මස ජනාධිපති මහින්ද රාජපක්ෂ යුද්ධය යලි දියත් කල අවස්ථාවේ පටන් හමුදාව නැගෙනහිර පලාතේ එල්ටීටීඊ බල මධ්‍යස්ථාන සියල්ල අල්ලා ගෙන තිබේ. පසුගිය වසරක කාලය තිස්සේ සිදු කෙරුනු මිලිටරි ආක්‍රමනික මෙහෙයුම් උතුරේ වන්නි කලාපයේ එල්ටීටීඊ භූමි ප්‍රදේශ තුලට ගැඹුරටම කාවැදී ඇත.

පූනරින් අල්ලා ගැනීමත් සමග ම, ආන්ඩුවේ හමුදා දැන් වන්නියේ බටහිර අර්ධයේ වැඩි ප්‍රමානයක් පාලනය කරන අතර එල්ටීටීඊයේ ප්‍රධාන මිලිටරි හා පරිපාලන මධ්‍යස්ථානය වන කිලිනොච්චිය ද තර්ජනයට ලක් කරති. එල්ටීටීඊය දැන් දිගින් කිලෝමීටර් 100කට හා පලලින් කිලෝමීටර් 60කට නොවැඩි ප්‍රදේශයකට සීමා වී පවතී. කිලිනොච්චියෙන් පිටත එහි ප්‍රධාන කඳවුරු පවතින්නේ නැගෙනහිර වෙරලේ මුලතිව් හා උතුරේ යාපන අර්ධද්වීපයට පිවිසෙන පටු දොරටුවක් වන අලිමංකඩ ය.

තමන් කිලිනොච්චිය අල්ලා ගැනීමට ආසන්න බවට ආන්ඩුවේ පුරසාරම් තිබිය දී ම, එම නගරය ආරක්ෂා කර ගැනීමේ ප්‍රයත්නයක් ලෙස එල්ටීටීඊය සෙසු ප්‍රදේශවලින් සටන්කරුවන් ගෙන විත් ඇති තතු යටතේ ආක්‍රමනික මෙහෙයුම එක තැන හිර වී ඇති බවක් පෙනී යයි. ස්වාධීන මාධ්‍යවේදීන්ට යුද පෙරමුනට යාමට අවසර නොදෙයි. කෙසේ වෙතත්, දෙපාර්ශ්වය ම දරුනු ජීවිත හා ශාරීරික හානි සිදු කර ඇති බව කියාපාන තතු යටතේ ගැටුම් දරුනු අතට හැරී ඇති බවක් පෙනී යයි.

කිලිනොච්චියට උතුරෙන් හමුදාව තවත් ආක්‍රමනික මෙහෙයුමක් දියත් කර තිබේ. අලිමංකඩට උතුරෙන් පිහිටි මුහමාලෙයිහි නොවැම්බර් 16 දා පැවති සටන්වලින් සොල්දාදුවන් 20ක් මරා දමා 80කට තුවාල සිදු කර ඇති බව එල්ටීටීඊය කියාපෑවේ ය. නොවැම්බර් 18 දා හමුදාව වාර්තා කලේ එම ප්‍රදේශයේ දී ම එල්ටීටීඊ සටන්කරුවන් 36ක් මරා දමා තවත් 90කට තුවාල සිදු කල බවයි. මෙම කියාපෑම් ස්වාධීනව තහවුරු කර ගැනීමේ මාර්ගයක් නැත.

සඳුදා, හමුදාව කිලිනොච්චියේ සිට කිලෝමීටර් 30ක් පමන දකුනින් පිහිටි මාන්කුලම් නම් මූලික නගරය ද කොලඹ සිට යාපනය බලා දිවෙන ඒ 9 මහා මාර්ගයෙන් කොටසක් ද අල්ලා ගත්තේ ය. මාන්කුලම් පිහිටා ඇත්තේ මාන්කුලම් සිට දිවෙන ඒ 34 මහා මාර්ගය ඒ 9 මාර්ගයට එක් වන ප්‍රධාන මංසන්ධියක ය. මෙම ඉදිරි මෙහෙයුම

නැගෙනහිර වෙරල ඔස්සේ මුලතිව් දෙසට ලගා වන තවත් හමුදා ඒකකයක් සමග එක් වීමේ තර්ජනය මතු කරයි.

එල්ටීටීඊ ස්ථානවලට පහර දීමට පමනක් නොව එල්ටීටීඊ-පාලිත භූමි ප්‍රදේශවල වසන සිවිල් ජනතාව ත්‍රස්ත කරනු සඳහා ද සිය සුපිරි වෙඩි බලය යොදා ගැනීමට මිලිටරිය පැකිලී නැත. සටන් හේතු කොට ගෙන 300,000ක පමන සිවිල් ජනතාවක් අවතැන්ව ඇති අතර ඔවුහු සීමිත ආහාර, සෙවන, ජල හා සනීපාරක්ෂක පහසුකම් සහිතව තාවකාලික කඳවුරුවල කල් ගෙවති. සියලු එක්සත් ජාතීන්ගේ හා ආන්ඩු නොවන ආධාර සංවිධානවලට ප්‍රදේශයෙන් ඉවත් වන ලෙස සැප්තැම්බරයේ දී ආන්ඩුව අන කලේ ය.

පෙබරවාරි මාසය තෙක් පවතිනු ඇති ඊසානදිග මෝසම් වර්ෂා ආරම්භ වීමත් සමග සරනගතයන් මුහුනු දෙන කටුක කොන්දේසි විස්තර කරමින් ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය ඊයේ නිවේදනයක් නිකුත් කලේ ය. "(වර්ෂාව) අවතැන් වූ ජනතාව දරුනු ව්‍යසනයකට ලක් කොට තිබේ. ඖෂධ පහසුකම් සීමිතව ඇති තතු යටතේ විශාල වසයෙන් ලෙඩ රෝග පැතිරයාමේ වර්ධිත අවදානමක් පවතී. අවතැන් වූ ජනතාව යලි ස්ථානගත කිරීමත් සමග රෝහල් වසා දමා හෝ ඒවා ද වෙනත් ස්ථාන කරා මාරු කිරීමට බල කෙරී ඇති බැවින් වන්නියේ සෞඛ්‍ය සේවා පද්ධතිය කාර්ය මන්ඩල හා සැපයුම් හිගයකින් දරුනු ලෙස පෙලෙයි. මැලේරියා තත්වයන් වර්ධනය වුව හොත් අදාල ප්‍රතිකාරවලට ප්‍රවිෂ්ට වීම රෝගීන්ට ඉතා අසීරු වනු ඇත."

හමුදා භටයන් සහ එල්ටීටීඊ කේඩර් ද සටන් වදින්නේ දුෂ්කර කොන්දේසි යටතේ ය. සොල්දාදුවන් මුහුන දෙන තත්වය විස්තර කරමින් පසුගිය සති අන්තයේ සන්ඩේ ටයිම්ස් මෙසේ ලිවීය: "පානීය ජලය නැත. බෝතල් කල ජලය විශාල ප්‍රමානයන්ගෙන් කොලඹ සිට ප්‍රවාහනය කිරීමට සිදුව තිබේ. යුද පෙරමුනේ සිටින සමහරුන්ට උනුසුම් ආහාර වේලක් යනු සුඛෝපභෝගී තත්වයකි. . . . ස්නානය සඳහා අවස්ථාවක් ලැබෙන්නේ ජල මූලාශ්‍රයන් පවතින විට ය. එය සතියකට හෝ දෙකකට වරක් පවා විය හැකි ය. තම හිතාදරයන් සමග කිසිදු සබඳතාවක් නැතිව සති ගනන් ගත වේ."

ලිපිය මෙසේ ද සඳහන් කලේ ය: "ඔවුන් යුද බිමේ දී තුවාල ලැබූ විට, ඉන් ඉවතට ගෙන යාම පිනිස එහි පිටුපස දක්වා ට්‍රැක්ටරයක අසීරු ගමනක් යාමට ඔවුන්ට සිදු වේ. එයට පැය තුනේ සිට හතර දක්වා කාලයක් ගත විය හැකි ය. රෝහල් කරා ඔවුන් ගුවන් හෝ ගොඩබිම් මාර්ගයෙන් ප්‍රවාහනය කෙරෙන්නේ ඉන් පසුව ය. -"

කෙසේ වෙතත්, ආන්ඩුව, රට පුරා පිරිහෙමින් පවතින ජීවන මට්ටම් කෙරෙන් අවධානය අපසරනය කරනු පිනිස මිලිටරි ජයග්‍රහන ලබා ගනු වස් මංමුලා සගහතව සිටී. පූනරින් අල්ලා ගැනීමෙන් පසුව, ආන්ඩුව "රනවිරුවන්ට උපහාර පුදනු" පිනිස සතියක කොඩි වැනීමේ ජාතයොන්මාදයක් නිවේදනය කලේ ය. රූපවාහිනියේ පෙනී සිටි ජනාධිපති රාජපක්ෂ, හමුදාවට ප්‍රශංසා කල අතර වහාම සිය අවි බිම තබා සාකච්ඡා මේසයට පැමිනෙන ලෙස එල්ටීටීඊ නායක වී. ප්‍රභාකරන්ගෙන් ඉල්ලා සිටියේ ය.

ආන්ඩුවේ උත්සව ශ්‍රීය යුද්ධයේ ආර්ථික බර දරා ගැනීමට බල කෙරී ඇති සාමාන්‍ය වැඩ කරන ජනතාව වෙතින් ප්‍රතිචාරයක් ජනිත කිරීමට සමත්ව නැත. රුපියල් බිලියන 200ක පෙර නොවූ විරූ අගයකට ආරක්ෂක වියදම් තවත් ඉහල නැංවීම ද මූලික ආහාර ද්‍රව්‍ය මත පැනවෙන බඳු ඇතුලුව බඳු තව දුරටත් ඉහල දැමීම ද පාර්ලිමේන්තුවේ දැන් විවාදයට ලක් කෙරෙන 2009 අයවැය යෝජනාවලට ඇතුලත් වේ. උද්ධමනය මේ වන විට සියයට 30 මට්ටමේ පවතී.

නව දිල්ලියේ දී පැවැත්වූ කතාවක දී, රාජපක්ෂ "දෙමල ජනතාව ආරක්ෂා කරන අතර ත්‍රස්තවාදයට එරෙහිව සටන් වදින" බව යලිත් වරක් කියාපා, තම ආන්ඩුව "දෙමල ජනයා සඳහා දේශපාලන විසඳුමක්" සපයන බව ද ප්‍රකාශ කලේ ය. එහෙත් මෙම ප්‍රකාශ විසින් මතු කෙරෙන සුවිශේෂී ප්‍රශ්නය නම් එවන් "දේශපාලන විසඳුමක්" අවශ්‍ය ඇයි ද යන්නයි. යථාර්ථය නම්, 25 වසරක වර්ගවාදී යුද්ධය ගෙන යනු ලබන්නේ "ත්‍රස්තවාදය" අවසන් කිරීමට නොව, දිවයිනේ දෙමල සුලුතරය මත කොලඹ සිංහල පාලක ප්‍රභූවේ ආධිපත්‍යය පවත්වා ගෙන යාම සඳහා බවය.

නොවැම්බර් 6 දා අයවැය ඉදිරිපත් කරමින්, රාජපක්ෂ පොරොන්දු වූයේ, නැගෙනහිර අල්ලා ගැනීමෙන් පසුව ආන්ඩුව එහි ක්‍රියාවට දැමූ පිලිවෙත්වලට සමානව, උතුරේ එල්ටීටීඊ බල මධ්‍යස්ථාන අල්ලා ගැනීමෙන් පසුව උතුරු වසන්තය නම් වැඩපිලිවෙලක් ක්‍රියාවට දමන බව යි. "දශක ගනනාවකට පසුව, උතුර සහ දකුන යා කරන සංවර්ධන මූලෝපායක් ක්‍රියාවට දැමීමේ අවස්ථාවක් මතු වෙමින් පවතින" බවට ඔහු පුරසාරම් දෙඩී ය.

ආන්ඩුව නැගෙනහිර පිහිටුවා ඇත්තේ, කුප්‍රකට පැරාමිලිටරි කන්ඩායමක් වන තමිල් මක්කල් විඩුතලෙයි පුලිහල් (ටීඑම්වීපී) විසින් පාලනය කරනු ලබන පලාත් පරිපාලනයක මූලිකත්වය යටතේ පවතින මිලිටරි වාඩිලෑමකි. "සංවර්ධනය" සමන්විතව ඇත්තේ, ලාභ ශ්‍රමය ලෙස ප්‍රාදේශීය ජනතාව සූරාකනු පිනිස ආයෝජකයන් ආකර්ෂනය කර ගැනීමේ ආරක්ෂිත කෙරුනු නිදහස් වෙලඳ කලාප පිහිටුවීම මගිනි. ඒ ආකාරයේ "මුදවා ගැනීමේ" සැකැස්මක් උතුර තුල ද පටවනු ඇති බවට සැකයක් නැත.


© www.wsws.org